සියලුම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| 7 ශ්‍රේණිය<br>தரம் 7<br>Grade 7 | ක්‍රිස්තු ධර්මය I හා II පත්‍රය<br>கிறிஸ்தவம் வினாத்தாள்-1-11<br>Christianity Paper I & II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |
|---|---|---|

සැලකිය යුතුයි

(i) සියලුම ප්‍රශ්න වල පිළිතුරු සපයන්න

(ii) අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරා ගන්න

## 1 වන කොටස

1) වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.

(01) දෙවියන් වහන්සේ මිනිසා මවා මිනිසාට ජීවය ලබා දුන්නේ,
1. දූවිල්ලෙන් 2. ජීවන හුස්මෙන් 3. රුධිරයෙන් 4. ගල් වලින්

(02) දේව මැවිල්ලේ ප්‍රධාන තැන හිමිවන්නේ,
1. මිනිසාට 2. සතුන්ට 3. ගස්වැල් 4. ආකාශ වස්තු

(03) දෙවි පියාණන් වහන්සේ මිනිසා පදිංචි කරනුයේ,
1. වනාන්තරයක 2. පාළුකරයේ 3. ඒදන් උයනේ 4. කාන්තාරයේ

(04) දෙවියන් වහන්සේ ස්ථිර ප්‍රේමය ගැන සඳහන් වන ග්‍රන්ථය,
1. උත්පත්ති 2. ගීතාවලිය 3. මතෙව් 4. ගණන් කථාව

(05) පෙරමඟ දූත සේවය ඉටු කරන ලද්දේ,
1. ජේසුස් වහන්සේ 2. දිවැසිවරු 3.පූජකයන් 4. ස්නාවක ජොහාන්තුමා

(06) මනස්ථාපනයේ බාහිර සළකුණ ලෙස හඳුන්වන්නේ,
1. යාච්ඤාව 2. බෞතීස්මය 3. චර්මඡේදනය 4. ශුද්ධ වූ සහභාගිකම

(07) අන්තිම රාත්‍රී භෝජනයේ දී මිදි යුෂ වලින් ජේසුස් වහන්සේ සංකේතවත් කළේ,
1. තම ශරීරය 2. සහභාගීකම 3. තම ශරීරයෙන් ගැලූ රුධිරය 4. පූජාවක්

(08) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාවන් ගණන,
1. 2 යි 2. 3 යි 3. 4 යි 4. 1 යි

(09) දේව මාලිගාවට යා නොහැකි කණ්ඩායම් දෙක වන්නේ,

1. දරුවන් හා පරිසිවරු
2. සද්දුසිවරු හා පරිසිවරු
3. අයකැමියන් හා සද්දුසිවරු
4. දරුවන් හා අයකැමියන්

(10) ජේසුස් වහන්සේ කුරුසියේ පැවසූ මුළු වදන් ගණන,

1. 7 යි
2. 5 යි
3. 4 යි
4. 3 යි

(11) ජේසුස් වහන්සේ ප්‍රේම කළ ශ්‍රාවකයා ලෙස හඳුන්වන්නේ,

1. පේදුරු
2. ජාකොබ්
3. ජොහාන්
4. ජුදස්

(12) ජේසුස් වහන්සේගේ උත්ථාපනය පිළිබඳ විශ්වාස නොකළ ශ්‍රාවකයා වන්නේ,

1. පේදුරු
2. තෝමස්
3. ජුදස්
4. ජොහාන්

(13) උත්ථාන වූ ජේසුස් වහන්සේ පිළිබඳව සත්‍ය ප්‍රකාශය වන්නේ,

1. උන්වහන්සේ අපගේ ජීවිත වලට පිළිගත යුත බව.
2. උන්වහන්සේ සමඟ යාච්ඤාවෙන් කථා කළ යුතු බව.
3. උන්වහන්සේ අප සමඟ ජීවමානව වැඩ වසන බව.
4. දේව වචනය තුළින් උන්වහන්සේට සමීප වීය හැකි බව.

(14) ශුද්ධාත්මයාණන්ගේ ආගමනය සිදුවූයේ,

1. පාස්කු මංගල්‍ය දින
2. පෙන්තකොස්ත දින
3. කුඩාරම් මංගල්‍ය දින
4. මහා සිකුරාදා

(15) "ගින්න" සංකේතවත් කරන්නේ,

1. ශුද්ධාත්මයාණන් වහන්සේ
2. දෙවියන් වහන්සේගේ බලය
3. ආරක්ෂාව
4. දෙවියන් වහන්සේගේ වැඩ සිටීම

(16) මුල් කිතුනු සභාව ගැන සඳහන් වන බයිබල් ග්‍රන්ථය

1. මතෙව්
2. ක්‍රියා
3. මාක්
4. ජොහාන්

(17) මුල් සභාවේ නායකයා වූයේ,

1. පේදුරු
2. ජාකොබ්
3. ජොහාන්
4. මරියතුමිය

(18) සතුරාට ප්‍රේම කිරීම පිළිබඳව ජේසුස් වහන්සේ කථා කරන්නේ,

1. ගෙත්සෙමන උයනේදී
2. අන්තිම රාත්‍රී භෝජනයේ දී
3. උන්වහන්සේගේ බෞතීස්මයේ දී
4. කන්ද උඩ දේශනයේ දී

(19) අපට පීඩා කරන්නන් උදෙසා අප කළ යුත්තේ,

1. වෛරය
2. ප්‍රේමය
3. යාච්ඤා කිරීම
4. සෙත් පැතීම

(20) ජේසුස් වහන්සේ විසින් අපට ඉගැන්වූ යාච්ඤාව වන්නේ,

1. රන් අණ
2. ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව
3. මැදහත් යාච්ඤාව
4. නාමෝ මරියනී යාච්ඤාව

*(2 × 20 = 40)*

03. වර්ග හා බැඳි සංස්කෘතික උත්සව අගයමු.

1. රාමසාන් උත්සවය පැවැත්වීමට හේතු 2 ක් ලියන්න. (ලකුණු 02)
2. එම උත්සවයෙහි ඇති ආගමික හා සංස්කෘතික වටිනාකම් 2 ක් ලියන්න. (ලකුණු 04)
3. එම උත්සවය හා බැඳි කලාත්මක අංග මොනවා ද ? (ලකුණු 04)

04. 1. ගැමි නැටුම යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)
2. කුළු නැටුමෙහි හා තාලම් නැටුමෙහි ඇති සුවිශේෂී ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු 04)
3. කුලු නැටුමෙහි කවියක් හා තාලම් නැටුමෙහි කවියක් ලියන්න. (ලකුණු 04)

The National e-learning Portal for The General Education

- **පළමු ප්‍රශ්නය අනිවාර්යයි, තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න. සම්පූර්ණ ප්‍රශ්න 5යි.**

1) <u>කෙටි පිළිතුරු ලියන්න.</u>

(i) ස්වභාවික විපත් 2ක් ලියන්න.

(ii) දෙවිඳුන්ගේ ස්ථිර ප්‍රේමය තුළ ලැබෙන වරප්‍රසාද 2 ක් ලියන්න.

(iii) පවුලක් වශයෙන් ජීවත් වීමේදී ලැබෙන වටිනාකම් 2 ක් ලියන්න.

(iv) ස්නාවක ජොහාන් තුමාගේ දෙමව්පියන්ගේ නම් ලියන්න.

(v) ස්නාවක ජොහාන් තුමාගෙන් බෞතීස්මය ලබා ගැනීමට පැමිණි ආගමික නායකයන් 2ක් නම් කරන්න.

(vi) ජේසුස් වහන්සේ ඉගැන්වීමට තෝරාගත් ස්වභාවික ස්ථාන 2 ක් ලියන්න.

(vii) පෙන්තකොස්ත දින සිදු වූ විශේෂ සිද්ධි 2 ක් ලියන්න.

(viii) මුල් කිතුනු සභාවේ ලක්ෂණ 2 ක් සඳහන් කරන්න.

(ix) මුල් කිතුනු සභාව මඟින් කළ ප්‍රථම ප්‍රාතිහාර්ය කුමක්ද?

(x) ඔබට සතුරුකම් කරන අය උදෙසා ඔබ කළ යුතු දේවල් 2 ක් ලියන්න.

*(2 × 10 = 20)*

(02) i) දේව මැවිල්ල අදත් සිදුවන බවට කරුණු 2ක් ලියන්න. *(ලකුණු 2)*

ii) මිනිසා පරිසරය විනාශ කරන අයුරු 3ක් ලියන්න. *(ලකුණු 3)*

iii) දෙවිඳුන් දුන් මැවිල්ල රැකබලා ගන්නා ක්‍රම 5ක් ලියන්න. *(ලකුණු 5)*

03) (i) අද සමාජයේ දරුවන්ට ඇති පීඩා 2 ක් නම් කරන්න. *(ලකුණු 2)*

(ii) ජේසුස් වහන්සේ කියා ඇති ලෙස දරුවන් වරදට යොමු කරන පුද්ගලයෙකුට ලැබිය යුතු දඬුවම කුමක්ද? *(ලකුණු 3)*

(iii) අද සමාජයේ දරුවන්ට ඇති වන පීඩා අවම කිරීම වෙනුවෙන් අපට කළ හැක්කේ කුමක්දැයි විස්තර කරන්න. *(ලකුණු 5)*

04) "මිනිසා කෑමෙන් පමණක් ජීවත් වන්නේය."

(i) ජේසුස් වහන්සේ මෙම පිළිතුර දීමට එතුමාට පැමිණි පරීක්ෂාව කුමක්ද? (ලකුණු 2)

(ii) දරුවන් ලෙස අපට ඇතිවන පරීක්ෂා 3 ක් ලියන්න. (ලකුණු 3)

(iii) අධ්‍යාත්මික දේවල ප්‍රිය කරන සමාජයක් තුළ ඉහත සඳහන් පාඨය අපගේ ජීවිත තුළ පෙන්නුම් කරන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 5)

(05) (i) රන් අණ ලියන්න. (ලකුණු 2)

(ii) මෙමගින් අපට හෙළිකරන ගුණාංග මොනවාද? (ලකුණු 3)

(iii) අප පාසල තුළ කිතුනු දරුවන් ලෙස මෙම ගුණාංග හෙළි දක්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

(06) "පියාණනි ඔවුන්ට කමා වුව මැනව. ඔවුන් කරන දේ ඔවුහු නොදනිති."

(i) ජේසුස් වහන්සේ කුරුසියේදී පැවසූ කීවෙනි වදනද? (ලකුණු 2)

(ii) මෙමගින් උන්වහන්සේ අපට ලබා දෙන ආදර්ශ 3 ක් ලියන්න. (ලකුණු 3)

(iii) අද අපි අපට වැරදි කරන අය වෙනුවෙන් ක්‍රියා කරන්නේ කෙසේද? ජේසුස් වහන්සේ කියා ඇති පරිදි ඔවුන් උදෙසා ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 5)

(07) (i) පේදුරු හා ජොහාන් සුව කළ කොර මිනිසා සිටියේ කොහේද? (ලකුණු 2)

(ii) මෙම අවස්ථාවේදී පේදුරු හා ජොහාන් රෝගියා පැවසූ වදන ලියන්න. (ලකුණු 3)

(iii) අපි අන්‍යයගේ සුවය වෙනුවෙන් ක්‍රියා කරන්නේ කෙසේදැයි? විස්තර කරන්න. (ලකුණු 5)